| |
|---|
| සිංහල භාෂාව හා සාහිත්‍ය තරඟ - 2024 (කලාප) |
| අපේක්ෂකයාගේ නම :- ...................................................................................................... |
| (මුලකුරු සමග නම) |
| පාසලේ නම හා ලිපිනය :- .................................................................................................. |
| ........................................................................................................................................ |
| පාසල් වර්ගය :- 200 ට අඩු/ 201-500/ 501 ට වැඩි |
| කලාපය :- ................................................................................................................ |

## ගද්‍ය රචනා හා ප්‍රායෝගික ලේඛන

**8 ශ්‍රේණිය**
**කාලය පැය 02 යි.**

- **I කොටසින් එකක් ද, II කොටසේ (අ) යටතේ එකක් ද, (ආ) යටතේ එකක් ද, (ඉ) යටතේ එකක් ද වශයෙන් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

### I කොටස

01. පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 300කට නොඅඩු රචනයක් ලියන්න.

(අ) විද්‍යාව හා තාක්ෂණය යහපතටම යොදගමු.
(ආ) සාරධර්ම සුරැකීම පාසලින් හුරුකරමු.
(ඇ) යහපත් සෞඛ්‍යය පුරුදු තුළින් නිරෝගිමත් ජීවිතයක්
(ඈ) ස්වභාවික විපත් වළකා ගනිමු
(ඉ) සාරධර්ම සුරැකීමේ වටිනාකම
(ලකුණු40)

### II කොටස

(අ)

(I) විද්‍යාලයේ බාලදක්ෂයෙකු/ බාලදක්ෂිකාවක ලෙස ඔබ තෝරාගෙන ඇතැයි සිතන්න. ඒ සඳහා ලාංඡන පැළඳවීමේ උත්සවයක් පැවැත්වීමට සූදනම් කර ඇත.මෙම උත්සවයට සහභාගී වනලෙස ඉල්ලමින් දුර බැහැර ප්‍රදේශයක සේවය කරන ඔබේ මවට ලිපියක් ලියන්න.

(II) ඔබ පාසැල් පුස්තකාලයේ තිබෙන්නේ සීමිත පොත් ප්‍රමාණයකි. එම සියළුම පොත් ඔබ කියවා අවසන් ය.ඒ නිසා නව පොත් පාසලට ලබාදෙන ලෙස ඉල්ලා ඇම්.ඩී. ගුණසේන සමාගම වෙත යවන ලිපිය ලියන්න.

(ලකුණු 20)

(ආ)

(I) ප්‍රදේශයේ සීග්‍රයෙන් පැතිර යන ඩෙංගු රෝගය පිලිබඳ දේශනයක් පැවැත්වීමට කටයුතු සූදනම් කොට ඇත. එයට ප්‍රදේශවාසී ජනතාව සහභාගි කර ගැනීම සඳහා ඔවුන් අතර බෙදහැරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(II) ඔබ පාසලේ පැවති නිවාසාන්තර ක්‍රීඩා උළෙලේදී නව තරඟ වාර්තා 03ක් පිහිටවූ අතර එම අවස්ථාව පිළිබඳ පුවත්පතකට යැවීම සඳහා වාර්තාවක් පිළියෙල කරන්න.

(ලකුණු 20)

(ඉ)

(I) විදුහලේ චිත්‍ර විෂය හදරන සිසු සිසුවියන් අතින් නිර්මාණය වූ චිත්‍ර එළිදැක්වීමේ චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට කටයුතු සූදනම් කර ඇත. ඒ පිළිබඳ ප්‍රචාරක කටයුතු ඔබට පැවරී ඇත. මෙම අවස්ථාවට සහභාගි වන ලෙස ඉල්ලා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.

(II) නවීන මත්ද්‍රව්‍ය සහිත උපකරණ භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් ඔබ විදුහලේ පැවැත්වීමට තීරණය කර ඇත. ඒ පිළිබඳ ප්‍රචාරක කටයුතු ඔබට පැවරී ඇත. ජනතාව දැනුවත් කිරීමට සුදුසු පෝස්ටරයක් සකස් කරන්න.

(ලකුණු 20)